**තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතිය- 2017**

**---------------------------------------------------**

තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ජූනි 20 දින එළඹි අංක 2733 එස්ආර්අයි (එස්එෆ්) හා අංක 2734 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.05 (අ) සහ 4.03 (අ) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලි බල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 සිට 06 කොටස්, 09 හා 10 කොටස් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර ව්‍යාපෘතියේ 07 සහ 08 කොටස් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 සිට 06 කොටස්, 09 සහ 10 කොටස් යටතේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන කාර්යයන් පිළිබඳ විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, විශ්වාසදායී, ප්‍රමාණවත් සහ දැරිය හැකි විදුලි බල සැපයුම ආවරණය වන ප්‍රදේශය පුළුල් කිරීම සහ (අ) නැගෙනහිර , උතුරු මැද, දකුණු හා ඌව පළාත්වල සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම. (ආ) නැගෙනහිර හා ඌව පළාත්වල ග්‍රාමීය විදුලිබල සැපයුම පුළුල් කිරීම සහ, (ඇ) බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වැඩිදුර සංවර්ධනය මඟින් සේවා බෙදා හැරීමේදී කාර්යක්ෂමතාවය සහ විශ්වාසදායී බව වැඩි දියුණු කිරීමයි.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,135.45 කට සමාන එජඩො මිලියන 162.03 ක් වන අතර ඉන් සියයට 74 ක් හෙවත් රු.මිලියන 13,428.09 කට සමාන එජඩො මිලියන 120.00 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබූ අතර, සියයට 26 ක් හෙවත් රු.මිලියන 4,707.36 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 42.03 ක් මූල්‍යායනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. 2011 නොවැම්බර් 17 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2014 අප්‍රේල් 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය 2016 ඔක්තෝබර් 30 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, ශ්‍රී ලංකා රජයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපෘතියේ කටයුතු 2017 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක

කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව සහ.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තා මගින් මතුකල කරුණු පිළිබඳ කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව සහ.

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව .

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2.. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, 2018 ජූලි 31 ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දින වන විට අදාල වත්කම් වල වටිනාකම ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත පවරා තිබුණද, පිරිවැය රු.මිලියන 2,567.22 ක් වූ නිම කළ වැඩ, පිරිවැය රු.මිලියන 489.39 ක් වූ මිලදීගත් මෝටර් වාහන සහ පිළිවෙලින් රු.මිලියන 210.73 ක් හා රු.මිලියන 113.07 ක් වූ අදාල ක්ෂය කිරීම් අඛණ්ඩව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, 2015 වර්ෂයේ වැඩ නිමකර ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට පවරන ලද වටිනාකම රු.මිලියන 10,256.70 ක්වූ කාර්යයන් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) 2015 නොවැම්බර් 26 දින කොන්ත්‍රාත්කරු රු.මිලියන 2.45 ක්වූ අත්තිකාරම් සෘජුවම ණයදෙන නියෝජිතායතනයට ආපසු ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 වන විටත් ලෙජර ගිණුම්වල ගැලපුම් සටහන් යොදා නොතිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ණය අරමුදලේ ඉතිරි කොටස සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රාග්ධන කාර්යයන් සඳහා වන ද්‍රව්‍ය, පොදු කාර්ය හා ශ්‍රමය අගය කිරීමේදී ව්‍යාපෘතිය පුරුද්දක් ලෙස සත්‍ය පිරිවැය ක්‍රමය වෙනුවට සම්මත පිරිවැය ක්‍රමය යොදාගනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පිරියත, දේපල හා උපකරණවල අගය රු.මිලියන 231.04 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 සැසඳුම් නොකළ වෙනස්කම්

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 11,249.02 ක්වූ ණය මුදලේ ඉතිරි කොටස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නඩත්තු කර වාර්තාවල දැක්වෙන සම ශේෂය වූ රු.මිලියන 11,443.39 සමඟ එකඟ නොවිනි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙහි කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 120.00 | 13,428.09 | - | 1.24 | 187.35 | 87.66 | 12,343.85 |
| ශ්‍රීලංර | 42.03 | 4,707.36 | - | - | - | - | - |
| **ලංවීම** | - | - | 150.00 | 1.78 | 269.96 | 15.39 | 2,333.02 |
| එකතුව | 162.03 | 18,135.45 | 150.00 | 3.02 | 457.31 | 103.05 | 14,676.87 |

විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක පීඊ/ටීඊඑන්/එස්සීඒපීසී/එස්ජී/2015/41 දරන ලිපිය මගින් ව්‍යාපෘතිය මගින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා පහළ මට්ටමක පැවති බව දක්වා තිබුණි. මෙම හේතුව නිසා 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4,652.73 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 30.41 ක මුදලක් වියදම් නොවී ඉතිරිව තිබූ බව විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

ලැබී ඇති තොරතුරු අනුව, ගාල්ල නව විදුලි සම්ප්‍රේෂණ සංවර්ධන වැඩ කටයුතු, උතුරු මැද විදුලි සම්ප්‍රේෂණය, ඌව පළාත් ග්‍රාමීය විදුලිබල සැපයුම පුළුල් කිරීම, මොරගොල්ල ජල විදුලි බලාගාරයේ ප්‍රතික්‍රියා බලශක්ති කළමනාකරණය (Reactive Power Management) සහ විස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම සකස් කිරීම පෙර වර්ෂයේ නිමකර තිබුණි. අම්පාර හා ඌව පළාතේ ග්‍රාමීය විදුලි බල සැපයුම පුළුල් කිරීම හා බෙදා හැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීමේ හා බෙදාහැරීමේ කටයුතු, කිරිබත්කුඹුර ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දිනට සිදු කෙරෙමින් පැවතුණු අතර නැවත ඉදිකරන සම්ප්‍රේෂණ මාර්ග 02 ක ද්‍රව්‍ය මිලදී ගැනීමේ කටයුතු එදිනට නිම වෙමින් පැවතුණි.

## 3.3 මූල්‍ය පාලනයේ දුර්වලතා

-------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ පමාවීම නිසා ණය දෙන ආයතනය විසින් බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 17.96 ක් අයකර ගෙන තිබුණි.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියලුම විදේශ ආධාර ව්‍යාපෘති සුපරීක්ෂණය කිරීමේ වගකීම ලංකා විදුලි බල මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් සිදුකරනු ලැබුවද, කොටස් 08 කින් සමන්විත මෙම ව්‍යාපෘතියේ එම කාර්යයන් අධීක්ෂණ කටයුතු ලංකා විදුලි බල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් යටතේ පැවතුණි.

(ඇ) ග්‍රාමීය විදුලිබල සැපයුම පුළුල් කිරීම සඳහා මිලදී ගත් රු.මිලියන 919.6 ක් වූ ද්‍රව්‍ය 2017 දෙසැම්බර් 31 දිනට භාවිතා කර නොතිබුණි. තවද, 2016 ඔක්තෝබර් 30 දින වන විට ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් අවසන් වී තිබුණද, පිරිවැය රු.මිලියන 211.3 කට මිලදී ගත් ගබඩා ද්‍රව්‍ය මාර්ගස්ථ භාණ්ඩ ලෙස දක්වා තිබුණි. තවද, ඌව පළාතේ හා අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය විදුලිබල සැපයුම පුළුල් කිරීම සඳහා මිලදීගත් රු.මිලියන 533.49 ක් පිරිවැය වූ ද්‍රව්‍ය 2017 දෙසැම්බර් 31 දින වන විට අනෙක් පළාත්වල උපකාර්යාල සඳහා බෙදා හැර තිබූ බව නිරීක්ෂණය විය.